# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 01 | රජයේ සේවකයකුට රුපියල් 10,000/- ක වැටුප් වැඩිවීමක් ලබාදීම හා එහි මූලික පියවර හැටියට වහාම ක්‍රියාත්මක වන පරිදි පෙබරවාරි මස වැටුපට රුපියල් 5,000/- ක වැටුප් වැඩිවීමක් ලබාදීම. | මුදල් | රාජ්‍ය පරිපාලන | මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 01-අ | සියලු දීමනා ඇතුළත් කොට ඒකාබද්ධ වැටුප් නිර්ණය කිරීමෙන් අනතුරුව හිඟ මුදල් ද සහිතව ඉතිරි වැටුප් වැඩිවීම් ලබාදීම. | මුදල්<br>ජාතික වැටුප් කොමිසම | රාජ්‍ය පරිපාලන | ජාතික වැටුප් කොමිසම ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. | මේ සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිසම විසින් අධ්‍යනය කෙරෙමින් පවතී. |
| 02 | මෝටර් සයිකල් ලබාදීමේදී අසාධාරණයට ලක් වූ රජයේ සේවකයන් ගැන සොයාබලා ඒ අයට ද එම සහනය ලබාදීම. | මුදල් | | ගරු මුදල් අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. | අදාළ මුදල් රජයට ගෙවා ඇති පුද්ගලයින් 30,000කට පමණ කඩිනමින් මෝටර් බයිසිකල් ලබාදීමට පියවර ගනිමින් සිටී. |
| 03 | දේශපාලන වහල් වැඩට යොදාගෙන ඇති උපාධිධාරීන් රාජ්‍ය සේවයට විධිමත් පරිදි ඇතුළු කොට ඔවුන්ගේ සුදුසුකම්වලට සරිලන උසස්වීම් ක්‍රමයක් ඇති කිරීම. | රාජ්‍ය පරිපාලන | ප්‍රතිපත්ති සම්පාදන | i. පවතින සේවා ව්‍යවස්ථාව නැවත සලකා බලමින් උසස්වීම් පටිපාටියක් හඳුන්වාදීම.<br>ii. වඩාත් යෝග්‍ය පරිදි මෙම නිලධාරීන් නැවත ස්ථානගත කිරීමට ඇති හැකියාව සොයා බැලීම. | i. උසස්වීම් පටිපාටිය සකස්කර ඇති අතර එය වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම විසින් සමාලෝචනය කෙරෙමින් පවතී.<br>ii. අදාල වෘත්තීය සමිතිද විමසමින් දැනට අනුමත කර ඇති සංවර්ධන නිලධාරීන් සඳහා වන සේවා ව්‍යවස්ථාව විශේෂ ශ්‍රේණියක් ඇතුළත් කළ හැකි පරිදි සංශෝධනය කරමින් පවතී. |
| 04 | විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කරනු ලබන තෙක් ඔවුන්ට රුපියල් 3,500/- ක මාසික අන්තර් දීමනාවක් ලබාදීම. | රාජ්‍ය පරිපාලන (විශ්‍රාම වැටුප්) | මුදල් | මේ සඳහා චක්‍රලේඛයක් නිකුත් කල යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 05 | රාජ්‍ය බැංකුවල තිබෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතුවල පළමු ලක්ෂ 10 සඳහා ගෙවනු ලබන පොලිය 15% දක්වා ඉහළ දැමීම. | ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) | | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් චක්‍රලේඛයක් නිකුත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 06 | සමෘද්ධි සහනාධාරය උපරිම 200% දක්වා වැඩි කිරීම. | නිවාස හා සමෘද්ධි ප්‍රතිපත්ති සම්පාදන | මුදල් | අයවැය කථාවේ සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 07 | දරුවකු ප්‍රසූත කරන සෑම මවකටම පෝෂ්‍යදායී ආහාර ලබාගැනීම සඳහා රුපියල් 20,000/- ක දීමනාවක් ලබාදීම. | රා.අ/ ළමා කටයුතු | මුදල්, සෞඛ්‍ය | අඩුබර දරු උපත් සිදුවීම වැළැක්වීම සඳහා ගැබිනි සමයේදීම අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර ලබාදීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 08 | අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වර්ග දහයක් සඳහා අය කරන අධික බදු ඉවත් කොට මිල පහත හෙළීම. මීට සමගාමීව අත්‍යාවශ්‍ය ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | මුදල් | | අයවැය කථාවෙහි සඳහන් පරිදි මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 09 | ඉන්ධනවලින් රජය අය කරන කෝටි 4,000 ක අධික තීරුබදු ඉවත් කර, ඉන්ධන මිල අඩු කරමින් එහි වාසිය මහජනයාට ලබාදීම. | මුදල් | විදුලිබල හා හා බලශක්ති | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. | |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 10 | ප්‍රවාහන කර්මාන්තයට අවශ්‍ය දිරි දීමනා ලබාදෙමින් රජයේ මෙන්ම පුද්ගලික අංශයේ ද පොදු ප්‍රවාහන සේවාවල ඵලදායීතාව ඉහළ නැංවීමට ක්‍රියා කිරීම. | අභ්‍යන්තර ප්‍රවාහන | මුදල් | විස්තරාත්මක යෝජනාවක් රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 11 | ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 300/- කින් අඩු කිරීම. | මුදල් | ආහාර සුරක්ෂිතතාව | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. | |
| 12 | වී කිලෝවක් මිලදී ගන්නා සහතික මිල රුපියල් 50/- දක්වා වැඩි කිරීම. | මුදල් | ආහාර සුරක්ෂිතතාව | මේ සම්බන්ධයෙන් 2015 පෙබරවාරි 05 දිනැති අයිතම 7 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව භාණ්ඩාගාරය විසින් අරමුදල් නිකුත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 13 | අර්තාපල් කිලෝවක් මිලදී ගන්නා සහතික මිල රුපියල් 80/- දක්වා ඉහළ දැමීම. | මුදල් | ආහාර සුරක්ෂිතතාව | අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කර සුදුසු වැඩ පිළිවෙලක් භාණ්ඩාගාරය විසින් සකස් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 14 | අමු තේ දළු කිලෝවක් සඳහා රුපියල් 80.00 - 90.00 අතර පාවෙන මිලක් පවත්වාගෙන යාම. | මුදල් | වැවිලි කර්මාන්ත | අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කර සුදුසු වැඩ පිළිවෙලක් භාණ්ඩාගාරය විසින් සකස් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 15 | රබර් සඳහා රුපියල් 350/- ක පාවෙන මිලක් පවත්වාගෙන යාම. | මුදල් | වැවිලි කර්මාන්ත | අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කර සුදුසු වැඩ පිළිවෙලක් භාණ්ඩාගාරය විසින් සකස් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 16 | කිරි ගොවීන්ට කිරි ලීටරයකට දැනට ගෙවන රුපියල් 60/- ක සහතික මිල රුපියල් 10/- කින් වැඩි කිරීම. | මුදල් | සමාජ සේවා සුබසාධන හා පශු සම්පත් | අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් සුදුසු වැඩ පිළිවෙලක් සකස්කර භාණ්ඩාගාරය වෙත ලබා දිය යුතුය | මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම සඳහා මිල යාන්ත්‍රණය පිළිබඳ යෝජනාවක් පශුසම්පත් අමාත්‍යාංශය විසින් සකස් කෙරෙමින් පවතී. කෙසේනමුත්, කිරි නිෂ්පාදනයේ යෙදී සිටින සියළුම රාජ්‍යය හා පෞද්ගලික ආයතන මෙම යෝජනාව 2015 ජුනි මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට එකඟත්වය පළකර ඇත. |
| 17 | සියලු ගොවි ණය 50% කින් කපා හැර ගෙවීමට ඇති ඉතිරි මුදල නැවත සමාලෝචනය කර ගෙවීමට සහන කාලයක් ලබාදීම. | ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) | මුදල්<br>වාරිමාර්ග හා කෘෂිකර්ම | මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් චක්‍රලේඛයක් නිකුත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 18 | දැනට ලබාදෙන, පසට ද බෝග වගාවට ද මනුෂ්‍යයාට ද අහිතකර බාල පොහොර වෙනුවට උසස් තත්ත්වයෙන් හා ප්‍රමිතියෙන් යුතු පොහොර ලබාදීම. | වාරිමාර්ග හා කෘෂිකර්ම ජාතික පොහොර ලේකම් කාර්යාලය | මුදල් | විශේෂඥවරුන්ගේ හා පර්යේෂණ ආයතනවල සහාය ඇතිව<br>i. උසස් තත්ත්වයේ පොහොර සහ රසායන වර්ග සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සකස් කිරීම.<br>ii. තහනම් කළයුතු අහිතකර රසායන වර්ග හඳුනා ගැනීම. | i. විද්වත් මණ්ඩලයේ සහය ඇතිව නව ප්‍රමිතීන් සකස් කර ඇත.<br>ii. වෙළඳ පොළට සැපයෙන පොහොරවල තත්ව පරීක්ෂාව සඳහා වැඩි නියදි සාම්පල ප්‍රමාණයක් ලබා ගැනීමට කටයුතු කර ඇත . |
| 19 | දැනට ලබාදෙන බාල පොහොර වෙනුවට ප්‍රමිතියෙන් යුතු පොහොර කුඩා තේවතු හිමියන් වෙත ලබා දීමට කටයුතු කිරීම. | වැවිලි කර්මාන්ත | මුදල් | විශේෂඥවරුන්ගේ හා පර්යේෂණ ආයතනවල සහාය ඇතිව<br>i. උසස් තත්ත්වයේ පොහොර සහ රසායන වර්ග සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සකස් කිරීම.<br>ii. තහනම් කළයුතු අහිතකර රසායන වර්ග හඳුනා ගැනීම. | i. ගුණාත්මක තත්වය සහතික කිරීම සඳහා පොහොර සාම්පල 520ක් ගාල්ල, මාතර, කළුතර, රත්නපුර සහ කෑගල්ල ප්‍රදේශවල පරීක්ෂා කිරීම අවසන් කර ඇත.<br>ii. පොහොර යෙදීම පිළිබඳ විද්‍යාත්මක ක්‍රමය පිළිබඳව දිස්ත්‍රික්ක 06 ක සහ ඌව පළාත තුළ තේ ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අවසන් කර ඇත. |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 20 | මහමුහුදේ දී ජීවිත අහිමිවන ධීවරයකු වෙනුවෙන් රුපියල් දස ලක්ෂයක රක්ෂණාවරණයක් රජයේ දායකත්වය ද ඇතුව ලබාදීම. | ස්වදේශ කටයුතු හා ධීවර | මුදල්<br>මහජන සාමය හා ආපදා කළමණාකරන | අදාළ පාර්ශවයන් විමසා වාර්තාවක් ලබා දෙන ලෙස රක්ෂණ සමාගම් සංගමයෙහි සභාපතිවරයා ගෙන් ඉල්ලීමක් කළ යුතුය. | අදාළ යෝජනාව සකස් කර ඇත.<br>රක්ෂණ යෝජනා ක්‍රමය ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| 21 | ගොවීන්ට වගා හානි රක්ෂණාවරණයක් රජයේ දායකත්වය ද ඇතුව ලබාදීම. | වාරිමාර්ග හා කෘෂිකර්ම | මුදල් | අදාළ පාර්ශවයන් විමසා වාර්තාවක් දෙන ලෙස රක්ෂණ සමාගම් සංගමයෙහි සභාපතිවරයා ගෙන් ඉල්ලීමක් කළ යුතුය. | අදාළ නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යෝජිත නව රක්ෂණ යෝජනා ක්‍රමය මුදල් අමාත්‍යාංශයට යොමු කර ඇත. |
| 22 | ගොවි සහ ධීවර ප්‍රජාව සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කිරීම. | මුදල්<br>වාරිමාර්ග හා කෘෂිකර්ම<br>රා. අ./ ධීවර | | පවතින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සලකා බලමින්, අමාත්‍යාංශය විසින් සුදුසු ඒකාබද්ධ වැඩසටහනක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. | අදාළ ආයතනයන්හි උපදේශකත්වය ලබා ගනිමින් යෝජනාවේ කෙටුම්පත සකස් කර ඇත. |
| 23 | ත්‍රීරෝද රථ රියැදුරු, මේසන් හෝ වඩුවැඩ, සුළු වෙළඳාම ඇතුළු අවිධිමත් රැකියා ක්ෂේත්‍රයන්හි නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කිරීම. | මුදල්<br>කර්මාන්ත හා වාණිජ කටයුතු | | පවතින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සලකා බලමින්, අමාත්‍යාංශ විසින් සුදුසු ඒකාබද්ධ වැඩසටහනක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. | ස්වයං රැකියාවන්හි නියුක්ත කණ්ඩායම් විසින් ඉදිරිපත්කරන ලද යෝජනා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් සමාලෝචනය කෙරෙමින් පවතින අතර ඔවුන් සමඟ තවදුරටත් සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. |
| 24 | විදේශ රැකියාවන්හි නියුතු සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කිරීම | විදේශ රැකියා<br>මුදල් | | දැනට පවතින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සලකා බලමින්, අමාත්‍යාංශය විසින් සුදුසු ඒකාබද්ධ වැඩසටහනක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. | සුදුසු විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව විසින් වැඩසටහනක් සකස් කෙරෙමින් පවතී |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 24-අ | මෙරට අනේවාසික ගිණුම් සඳහා 2.5% පොලියක් දැනට ඇති පොලියට එකතු කිරීම. | මුදල් විදේශ රැකියා | ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) | ජනතා අදහස් ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත්කොට ඒ අනුව යෝජනා කෙටුම්පත් සකස් කළ යුතුය. | අනේවාසික ගිණුම් සඳහා ඉහළ පොළියක් ගෙවන ලෙස වාණිජ බැංකු වලට දන්වා ඇත |
| 25 | මැද පෙරදිග ඇතුළු පිටරටවල ශ්‍රමය කැප කරන ශ්‍රී ලාංකිකයන්ගේ පවුල් රැකබලා ගැනීම සඳහා විශේෂ පවුල් සුරැකුම් වැඩසටහනක් ආරම්භ කිරීම. | විදේශ රැකියා රා.අ/ ළමා කටයුතු | කාන්තා කටයුතු | දැනට පවතින පවුල් සුරැකුම් වැඩසටහන් සලකා බලමින් අමාත්‍යාංශය විසින් ඒකාබද්ධ වැඩසටහනක් ඉදිරිපත් කළ යුතුය. | අදාළ ඒකාබද්ධ වැඩසටහන සකස් කර අමාත්‍ය මණ්ඩලය දැනුවත්කර ඇත . අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අදාළ නිළධාරීන් සමග සාකච්ඡා කරමින් පවතී . |
| 26 | උපරිම රුපියල් ලක්ෂ දෙකක වටිනාකමකට උකස් කර ඇති රන් භාණ්ඩ සඳහා ගෙවිය යුතු අධික පොලිය හා දඩ මුදල් කපා හැරීම. | මුදල් ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) | | මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ උපදෙස් සංග්‍රහය නිකුත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 27 | විවිධ මූල්‍ය ආයතන මඟින් දෙන ලද පොරොන්දු, ක්‍රෙඩිට් කාඩ් යෝජනා හා පිරමීඩ ක්‍රම මඟින් රැවටීමට ලක්වීම නිසා පැටවී ඇති ණය පිට ණය කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | මුදල් ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) | | මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ උපදෙස් සංග්‍රහය නිකුත් කළ යුතුය. | i. ගෝල්ඩන් කී ක්‍රෙඩිඩ් කාඩ් සමාගම ද සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන් ෆිනෑන්ස් පී එල් සී ද ඇතුළත්ව මෙවැනි මූල්‍ය ආයතනයන්හි තැන්පත්කරුවන් සමඟ සාකච්ඡා පවත්වා ඇත.<br>ii. අදාළ තැන්පත්කරුවන්ට සහන සැලසීම සඳහා යෝග්‍ය යාන්ත්‍රණයක් සකස්කෙරෙමින් පවතී. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 28 | ස්ත්‍රී දූෂණ, ළමා අපචාර හා කාන්තාවන්ට එරෙහිව ලිංගික අඩන්තේට්ටම් වළක්වා කාන්තාවන්ට හා ළමුන්ට අප රටේ නිදහසේ ජීවත් වීමට හැකිවනු පිණිස නව නීති සම්පාදනය කිරීම හා නීතිය තදින් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම. | අධිකරණ<br>කාන්තා කටයුතු<br>රා.අ/ ළමා කටයුතු | | දැනටමත් ඉදිරිපත් කර ඇති ළමුන් සඳහා අධිකරණ රැකවරණය සැලසීමේ පනත් කෙටුම්පත සමාලෝචනය කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 29 | යුද්ධයේදී වැන්දඹු වූ සියලු ජන කොටස්වල කාන්තාවන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට විශේෂ රැකවරණ ක්‍රමයක් හඳුන්වාදීම. | කාන්තා කටයුතු | සමාජ සුබසාධන හා පශු සම්පත් සංවර්ධන | පවතින වැඩසටහන සලකා බලමින් සුදුසු යෝජනාවක් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 30 | දේශපාලන තීරණ ගැනීම සඳහා කාන්තා සහභාගිත්වය වැඩි කිරීම පිණිස පළාත් පාලන හා පළාත් සභාවල මන්ත්‍රීවරියන්ගේ සංඛ්‍යාව අවම වශයෙන් 25% ක් වත් වියයුතු බවට නීති සම්පාදනය කිරීම. | කාන්තා කටයුතු<br>ප්‍රතිපත්ති සම්පාදන<br>රාජ්‍ය පරිපාලන | | මැතිවරණ කොමසාරිස්වරයා ඇතුලු අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් මූලික කටයුතු ආරම්භ කළ යුතුය | කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා උපායමාර්ගයක් සකස් කර ඇත. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 31 | අපේ තරුණ පරපුරේ අසහනයට මුල් වී ඇති විරැකියාව සහමුලින්ම තුරන් කිරීම ඉලක්ක කරගත් දේශීය හා විදේශීය රැකියා හා ස්වයං රැකියා දස ලක්ෂයක් සැපයීමේ වැඩසටහන ආරම්භ කිරීම. | ප්‍රතිපත්ති සම්පාදන මුදල් | කර්මාන්ත හා වාණිජ කටයුතු මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන විදේශ රැකියා | අදාළ සියලු පාර්ශවයන් විමසා අප්‍රේල් මස මුල් සතිය වන විට සුදුසු යෝජනා ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. | අදාළ වාර්තාව අවසන් කර ඇත |
| 32 | තරුණ තරුණියන්ට තමන් කැමති මතයක් දැරීමට, ප්‍රකාශ කිරීමට හා ඒවා පිළිබිඹු වන පරිදි නිර්මාණකරණයේ යෙදීමට මෙන්ම නිදහසේ තරුණ ජීවිතය භුක්තිවිඳීමට ඇති අයිතිය තහවුරු කිරීම. | රා.අ/ තරුණ කටයුතු ප්‍රතිපත්ති සම්පාදන | | තරුණ ප්‍රඥප්තිය කෙටුම්පත් කළ යුතුය. සෑම දේශපාලන පක්ෂයකම තරුණ සාමාජිකයින්(1/3 ක් කාන්තා සාමාජිකයින් වන පරිදි) වැඩසටහනට සම්බන්ධ වන බවට තරුණ සේවා සභාව සහතික විය යුතුය. | තරුණ ප්‍රඥප්තියෙහි පළමු කෙටුම්පත සකස් කර ඇත. එය වැඩිදියුණු කිරීම සඳහා අදාල පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීමෙන් අනතුරුව 2015 අගෝස්තු මස තරුණ ප්‍රඥප්තිය එළිදැක්වීමට කටයුතු යොදා ඇත |
| 33 | නොමිලයේ ඉන්ටර්නෙට් ලබාදීම, සෑම නගරයකම ප්‍රසිද්ධ ස්ථානවල WiFi කලාප ඇති කිරීම. | ප්‍රතිපත්ති සම්පාදන විදේශ කටයුතු (ICTA) | රා.අ/ තරුණ කටයුතු | නොමිලයේ අන්තර්ජාල පහසුකම් ලබාදීම සඳහා සෑම නගරයකම, ප්‍රසිද්ධ ස්ථානවල WiFi කලාප ඇති කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 34 | යොවුන් පාර්ලිමේන්තුවට මුදල් බලතල ලබාදී යෞවන සමාජ හා අනෙකුත් තරුණ සංවිධානවලින් ඉදිරිපත් කරන තරුණ වැඩසටහන් සඳහා වියදම් කිරීමට 2015 සඳහා රුපියල් මිලියන 250 ක් යොවුන් පාර්ලිමේන්තුවට වෙන් කිරීම. | මුදල් ප්‍රතිපත්ති සම්පාදන | රා.අ/ තරුණ කටයුතු | රේඛීය අමාත්‍යාංශ විසින් අදාළ ව්‍යාපෘති හඳුනා ගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 35 | ණය තොරතුරු ඒකකයේ (CRIB) අසාධු ලේඛනයට ඇතුළත්ව ණය උගුලේ හිරවී ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සහ ක්‍රෙඩිට් කාඩ් හිමියන් ඉන් මුදවාගෙන ලිහිල් කොන්දේසි සහිතව ණය ගෙවීමට අවස්ථාවක් සලසාදීම | මුදල් ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) | කර්මාන්ත හා වාණිජ | මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ආයතන සමඟ සාකච්ඡා කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාර්ගෝපදේශ සංග්‍රහයක් නිකුත් කළ යුතුය. | i. යෝජිත වැඩසටහන සකසා අවසන්කර ඇත.<br>ii. රාජ්‍ය බැංකු දෙකක් වෙත (ලංකා බැංකුව සහ මහජන බැංකුව) මාර්ගෝපදේශ සපයා ඇත. |
| 36 | ආර්ථිකය හසුරුවන අතළොස්සක් වූ කැසිනෝ, මත්කුඩු, එතනෝල් ජාවාරම්කරුවන් වෙනුවට රටේ දියුණුව වෙනුවෙන් කැපවූ දේශීය ව්‍යාපාරික ප්‍රජාවක් බිහි කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙනුවෙන් ලිහිල් කොන්දේසි සහිත සහනදායී ණය ක්‍රමයක් හඳුන්වාදීම. | මුදල් ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) | කර්මාන්ත හා වාණිජ | පවතින වැඩ සටහන් සමාලෝචනය කරමින් ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය විසින් සුදුසු යෝජනාවක් ඉදිරිපත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 37 | අපනයන සහ රැකියා වැඩි කිරීම ඉලක්ක කරගෙන GSP + සහනය යළි ලබාගැනීම. | කර්මාන්ත හා වාණිජ කටයුතු විදේශ කටයුතු | ප්‍රතිපත්ති සම්පාදන | අදාළ අමාත්‍යාංශ විසින් මේ සඳහා සුදුසු ඒකාබද්ධ උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතුය. | මේ සම්බන්ධයෙන් පත් කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් කරුණු අධ්‍යයනය කරමින් පවතී. |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 38 | දැනට කෙරීගෙන යන මූල්‍ය ආයතන හා බැංකු ඒකාබද්ධ කිරීමේ වැඩසටහන නැවත සමාලෝචනයට ලක් කිරීම. | මුදල් ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව | | අදාළ පාර්ශවයන් සමඟ සමාලෝචනය කළ යුතුය. | ඒකාබද්ධ සමාලෝචන කමිටුව විසින් සකස්කරන ලද වාර්තාවේ දළ පිටපතක් කරුණු නිරීක්ෂණය සඳහා මහබැංකුව වෙත ඉදිරිපත්කර ඇත. |
| 39 | ක්ෂුද්‍ර ණය පාලනය කිරීම හා සංවර්ධනය කිරීමට ස්වාධීන අධිකාරියක් පිහිටුවීම. | ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) | මුදල් | මේ සම්බන්ධයෙන් ලංකා ක්ෂුද්‍ර මූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය විසින් ඉදිරිපත් කරන ලද යෝජිත කෙටුම්පත සඳහා මහජනතාවගේ සහ අදාළ රාජ්‍ය ආයතනවල අදහස් ලබා ගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 40 | කුඩා ව්‍යවසායකයන් ආරක්ෂා කර ගැනීම සඳහා රජයේ කාර්යාංශයක් පිහිටුවීම. | ප්‍රතිපත්ති සම්පාදන (ශ්‍රී ලංකා මහ බැංකුව) කර්මාන්ත හා | මුදල් | මේ ක්ෂේත්‍රයට අදාළව දැනට පවතින රාජ්‍ය ආයතන හඳුනාගෙන, ඒවායේ කාර්යභාරය සමාලෝචනය කර ඉදිරි ක්‍රියාමාර්ගයක් යෝජනා කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 41 | ත්‍රිරෝද රථ ක්ෂේත්‍රය වෙනුවෙන් ත්‍රිරෝද රථ හිමියන්, බැංකු නියෝජිතයන් ඇතුළත් කමිටුවකින් සමන්විත රජයේ කාර්යාලයක් ඇති කිරීම. | අභ්‍යන්තර ප්‍රවාහන ප්‍රතිපත්ති සම්පාදන | මුදල් | අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය විසින් රක්ෂණ සමාගම්, මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ත්‍රී රෝද රථ සංගම් සමඟ සාකච්ඡා කොට යෝජනාවලියක් සකස් කළ යුතුයි. | කමිටු වාර්තාව අවසන් කර, එය නිති සම්පාදක වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 42 | අයවැයෙන් නිදහස් සෞඛ්‍යය සඳහා දැනට වෙන් කර ඇති 1.8% ක් පමණ වන මුදල 3% දක්වා ඉහළ දැමීම | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය මුදල් | ප්‍රතිපත්ති සම්පාදන | සෞඛ්‍ය අංශය සංවර්ධනය කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන වැඩි කිරීමට ප්‍රමුඛතා පදනම් කර ගත් උපායමාර්ගික සැලැස්මක් සකස් කර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 43 | රජයේ රෝහල්වල ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගියකුට අවශ්‍ය සියළුම බෙහෙත් අඩුපාඩුවකින් තොරව රෝහලෙන්ම ලබාදීම. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය | මුදල් | අදාළ වෘත්තීය සමිති සහ විශේෂඥයින් සමඟ සාකච්ඡා කර දැනට පවතින ප්‍රසම්පාදන හා බෙදා හැරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 44 | රජයේ රෝහල්වල සැත්කම් සඳහා පොරොත්තු ලේඛනවල සිටින සියළුම රෝගීන්ගේ සැත්කම් නිම කිරීමේ කඩිනම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය | මුදල් | අදාළ වෘත්තීය සමිති සහ විශේෂඥයින් සමඟ සාකච්ඡා කර සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතුය | රජයේ රෝහල්වල පවතින සැත්කම් හා වෙනත් ප්‍රතිකාර සඳහා වන පොරොත්තු ලේඛන අවම කිරීම සඳහා විකල්ප විසඳුම් සලකා බලමින් පවතී. |
| 45 | රජයේ රෝහල්වල බාහිර ප්‍රතිකාර අංශය රාත්‍රී 10.00 දක්වා විවෘත කර තැබීම. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය | මුදල් | මේ සඳහා අමාත්‍යාංශය විසින් සුදුසු පියවර ගත යුතුය | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 46 | වකුගඩු රෝගයට තුඩු දෙන බවට සැක කරන වල් නාශක වර්ග, අනෙකුත් කෘෂි රසායන ද්‍රව්‍ය තාවකාලිකව ආනයනය තහනම් කිරීම හා වකුගඩු රෝගය වැළැක්වීම සඳහා කෙටි කාලීන මෙන්ම දිගුකාලීන සැලසුම් සම්පාදනය කොට ඒවා ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම. | වාරිමාර්ග හා කෘෂිකර්ම | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය | විශේෂඥවරුන්ගේ හා පර්යේෂණ ආයතනවල සහාය ඇතිව<br>i. උසස් තත්ත්වයේ පොහොර සහ රසායන වර්ග සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සකස් කිරීම.<br>ii. තහනම් කළයුතු අහිතකර රසායන වර්ග හඳුනා ගැනීම. | WHO වාර්තා අනුව සැක කටයුතු පලිබෝධනාශක 04 න් 03 ක් (කාබෆියුරාන්, ක්ලෝරොෆයිරොෆොස් හා ප්‍රොපොනිල්) ආනයනය සම්පූර්ණයෙන් තහනම් කර ඇත. ඉතිරි පලිබෝධනාශකය වන ග්ලයිෆොස්ට් සඳහා විකල්පයක් නොමැති බැවින් වකුගඩු රෝගය ප්‍රචලිත දිස්ත්‍රික්ක 05 ක ඒවා විකිණීම හා භාවිතය තහනම් කර ඇත. එම කෘෂි රසායනය ආනයනය සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීමට කටයුතු කර ඇත. |
| 47 | ආහාර, රූපලාවන්‍ය භාණ්ඩ හා සේවා, ඖෂධ ආදී සියලු පාරිභෝගික භාණ්ඩ නියාමනය සඳහා ශක්තිමත් ආයතනයක් පිහිටුවීමට පියවර ගැනීම. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය | ආහාර සුරක්ෂිතතාව (පාරිභෝගික කටයුතු ආරක්ෂක අධිකාරිය) | i. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි තීරණය ක්‍රියාත්මක කිරීම.<br>ii. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය ශක්තිමත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 48 | ආයුර්වේද ප්‍රජා වෛද්‍ය සෞඛ්‍ය සේවය සවිබල ගැන්වීමට කටයුතු කිරීම. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ප්‍රතිපත්ති සම්පාදන | | අදාළ අමාත්‍යාංශ විසින් විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 49 | සියලු බටහිර, පෙරදිග හා දේශීය වෛද්‍ය ක්‍රම මනා ලෙස සම්බන්ධීකරණය කර ඒකාබද්ධ සේවාවක් ජනතාවට සැපයීමට අවශ්‍ය පියවර ගැනිම. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ප්‍රතිපත්ති සම්පාදන | | 1961 අංක 31 දරන පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් විස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. | ඉන්දියාවේ භාවිතාවේ යෙදෙන බටහිර හා පෙරදිග ඒකාබද්ධ ප්‍රතිකාර ක්‍රම අධ්‍යයනය කරමින් පවතී. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 50 | හෙරොයින්, කේරල ගංජා, ටැබා ඇතුළු සියලු මත්ද්‍රව්‍ය නිශ්චිත කාලසටහනකට අනුව සහමුලින්ම තුරන් කිරීමට ප්‍රමුඛතාව ලබාදීම සහ දැනට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇති තරුණ පිරිස් පුනරුත්ථාපනය කිරීම සඳහා දීපව්‍යාප්ත කඩිනම් වැඩසටහනක් විදේශ ආධාර ඇතිව දියත් කිරීම | මහජන සාමය අධිකරණ | ජනමාධ්‍ය (ජාතික අන්තරාකර ඖෂධ පාලක මණ්ඩලය) | i. මත් ද්‍රව්‍ය උවදුර දුරු කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන දියත් කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් වන නීතිමය පියවර ගැනීම් කටයුතුද කඩිනම් කළ යුතුය.<br>ii. දැනට පවතින වැඩ සටහන් සමාලෝචනය කරමින් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 51 | මත්කුඩු ජාවාරම්කරුවන් මැඩලීම සඳහා ඒකාබද්ධ විශේෂ බලකායක් පිහිටුවීම. | ජනාධිපති ලේකම් කාර්යාලය අධිකරණ | මහජන සාමය | මේ සඳහා සුදුසු සාමාජිකයන්ගෙන් යුත් ක්‍රියාකාරි කමිටුවක් පත් කළ යුතුය | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 52 | දුම්වැටි ඇසුරුම්වල රූපමය සෞඛ්‍ය අවවාද 80% දක්වා වැඩි කිරීම | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය | | මේ සඳහා අමාත්‍යාංශය විසින් සුදුසු පියවර ගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 53 | ත්‍රෛනිකායික මහනායක හිමිවරුන්ගේ හා මහජනයාගේ විරෝධ මධ්‍යයේ අප්‍රමාණ බදු සහන ලබාදුන් කැසිනෝ බලපත්‍ර අවලංගු කිරීම. | මුදල් ප්‍රතිපත්ති සම්පාදන | උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන | මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් විසින් කටයුතු කළ යුතුය. | උපාය මාර්ගික සංවර්ධන පනත යටතේ නිකුත් කළ නිවේදන අහෝසි කිරීමට කටයුතු කෙරෙමින් පවතී.<br><br>ආයෝජන මණ්ඩලය අදාළ නීතිමය ප්‍රතිපාදන සංශෝධනය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටින අතර ප්‍රකාශයට පත්කිරීම නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකොට ප්‍රතිචාර අපේක්ෂිතව ඇත. |
| 54 | රේගු බදු නොගෙවා සිදු කරන එතනෝල් ජාවාරම මර්ධනය කිරීම. | මුදල් මහජන සාමය | | i. අපරාධකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කිරීම සඳහා බලධාරීන් විසින් නීතිපතිවරයා විමසා කටයුතු කළ යුතුය.<br>ii. එතනෝල් ආනයනය හා පරිහරණය සඳහා ඇති අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය විසින් වැඩපිළිවෙලක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. | සුරාබදු දෙපාර්තමේන්තුවේ, රේගු දෙපාර්තමේන්තුවේ සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ එතනෝල් ආනයනය සඳහා බලපත්‍ර නිකුත්කිරිමට පියවර ගෙන ඇත.<br><br>නීත්‍යානුකූල නොවන එතනෝල් ආනයනය නැවැත්වීම අධීක්ෂණය සඳහා ක්‍රමවේදයක් සකස් කෙරෙමින් පවතී. |
| 55 | දැනට නිදහස් අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති 1.7% ක් පමණ වන ප්‍රතිපාදන 6% ඉලක්කය කරා යාම ආරම්භ කිරීම. | ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) | අධ්‍යාපන උසස් අධ්‍යාපන මුදල් | ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය විසින් ප්‍රතිපත්ති අධ්‍යන ආයතනයේද සහාය ඇතුව අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතා පදනම් කර ගත් උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතුය. | උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පවතී. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 56 | උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පවරාගෙන ඇති විශ්වවිද්‍යාලවල බලතල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා නැවතත් විශ්වවිද්‍යාලවලට ලබාදී දේශපාලනීකරණයට ලක්ව ඇති විශ්වවිද්‍යාල ඉන් ගලවා ගැනීම. | උසස් අධ්‍යාපන (විශ්වවිද්‍යාල කොමිෂන් සභාව) ප්‍රතිපත්ති සම්පාදන | | විශ්ව විද්‍යාල වල ස්වාධීනත්වයට බාධාකාරී නීති රෙගුලාසි ඉවත් කිරීම සඳහා එක්සත් විශ්ව විද්‍යාල ආචාර්ය සංගමයේ (FUTA) සහ වෙනත් අදාළ පාර්ශවයන්ගේ අදහස් ලබාගත යුතුය. | අමාත්‍යවරයා විසින් පවරාගෙන ඇති විශ්වවිද්‍යාලවල බලතල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා නැවතත් විශ්වවිද්‍යාලවලට ලබාදීම සඳහා චක්‍රලේඛය සකස් කරමින් පවතී. මෙයට අදාලව විශ්වවිද්‍යාල ආචාර්ය සංගමය මගින් යෝජනා ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳ සවිස්තරාත්මක යෝජනාවක්ද සකස් කරමින් පවතී. |
| 57 | සරසවි මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000/- ක් දක්වා වැඩි කිරීම. | මුදල්<br>උසස් අධ්‍යාපන (විශ්වවිද්‍යාල කොමිෂන් සභාව, මහපොල අරමුදල) | | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ සඳහා අතිරේකව අවශ්‍යවන මූල්‍යමය අවශ්‍යතාව මහපොළ භාරකාර අරමුදල මඟින් දැරීම සඳහා හඳුනාගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 58 | උසස් පෙළ විෂයයන් තුනක් සමත් සියලු දෙනාට උසස් ඩිප්ලෝමාවක් හෝ උපාධියක් දක්වා ඉගෙන ගැනීමට අවකාශ සම්පාදනය කිරීම. | උසස් අධ්‍යාපන | රා.අ/ තරුණ කටයුතු | ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලයෙන් සවිස්තරාත්මක යෝජනාවක් ලබාගැනීම. | මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වාර්තාව අවසන් කර ඇත |
| 59 | පාසල්වලට, පළමු වසරට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා සාධාරණ, විනිවිද පෙනෙන ක්‍රමවේදයක් සකස් කිරීම | අධ්‍යාපන | | දැනට පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් යෝජනාවලියක් ඉදිරිපත් කළ යුතුය. | මේ සඳහා සුදුසු යෝජනාවක් සකස් කිරීමට කමිටුවක් පත්කර ඇත. කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇත. පළමු වසරට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කරමින් පවතී. චක්‍රලේඛය සකස් කර ඇත |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 59-අ | පළමු වසරට ඇතුළත්වීමේ දී දැනට අසාධාරණයට ලක්ව ඇති දරුවන්ට කඩිනම් සහන සලසාදීම. | අධ්‍යාපන | | දැනට පවත්නා වැඩපිළිවෙල මෙම ගැටලුව විසඳීමට ප්‍රමාණවත් නොවේනම් අමාත්‍යාංශය විසින් සුදුසු යෝජනාවක් කඩිනමින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. | මේ පිලිබඳ මහජන දුක්ගැනවිලි පිළිබඳ අභියාචනා / පැමිණිලි භාර ගැනීම සඳහා අමාත්‍යාංශය තුල විශේෂ කවුළුවක් විවෘතව පවතී.<br><br>එවැනි අභියාචනා / පැමිණිලි අධ්‍යාපනය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් යුත් කමිටු 05 ක් මගින් සමාලෝචනය කරමින් පවතී. මේ දක්වා ලැබුනු අභියාචනා 2402 න් 404 ක් සම්බන්ධව තීරණ ගෙන ඇත. |
| 60 | පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේදී දැනට පවතින ප්‍රමාදයන් සම්පූර්ණයෙන්ම නැති කර පළමු වාරය ආරම්භ වන විට සියලු දරුවන්ට පාසල් ලබාදීම සහතික කිරීම. | අධ්‍යාපන | | පාසැල්වලට සිසුන් ඇතුළත් වීමේ දැනට පවතින ක්‍රමවේදය අමාත්‍යාංශය විසින් විධිමත් කළ යුතුය. | මේ සඳහා සුදුසු යෝජනාවක් සකස් කිරීමට කමිටුවක් පත්කර ඇත. කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇත. පළමු වසරට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කරමින් පවතී. චක්‍රලේඛය සකස් කර ඇත |
| 61 | පාසල්වල ආගම ඉගැන්වීමේ චක්‍රලේඛය සියලු පාසල් අරභයා ක්‍රියාත්මක කිරීම, එම වැඩ කටයුතු සොයා බැලීම සඳහා සියලු ආගම්වල නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම. | අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන, අධිකරණ | සියලුම ආගමික කටයුතු අමාත්‍යාංශ | අදාළ අමාත්‍යාංශ විසින් සර්ව ආගමික සමුළුවේ අදහස් ලබාගෙන නීතිපතිවරයාගෙන් උපදෙස් ලබාගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 62 | ජාත්‍යන්තර පාසල් රජයේ අධීක්ෂණයට භාජනය කිරීම. | අධ්‍යාපන | | මේ සඳහා ස්වාධීන නියාමන අධිකාරියක් / ඒකකයක් පිහිටුවීම සඳහා අමාත්‍යාංශය විසින් පාසල් ප්‍රධානීන් ගුරු-දෙගුරු සංගම් හා වෘත්තීය සමිති සමඟද සාකච්ඡාකොට සුදුසු වැඩපිළිවෙලක් ඉදිරිපත් කල යුතුය. | i. දැනට පවත්නා නියාමනයන් සංශෝධනය සඳහා නීතිපති දෙපාර් තමේන්තුවෙන් නීති උපදෙස් ලබා ගෙන ඇත.<br>ii. 1961 අංක 08 දරණ පනතේ මෙම විෂයට අදාල අංක 25 දරණ වගන්තිය සංශෝධනය කිරීම පිළිබඳ වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ කෙටුම්පත ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර ඇත. |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 63 | ධීවර යාත්‍රා, දැල් ආම්පන්න සහ බෝට්ටු එන්ජින් සඳහා දැනට පනවා ඇති අධික බදු ඉවත් කිරීම. | ස්වදේශ කටයුතු හා ධීවර | මුදල් | මේ සඳහා සුදුසු පියවරක් ගැනීමට අවශ්‍ය අදාළ තොරතුරු මුදල් අමාත්‍යාංශය වෙත ලබාදිය යුතුය | පහත සඳහන් අයිතමයන් සඳහා අපනයන බදු මුදල් අඩු කිරීමට මුදල් අමාත්‍යාංශය එකඟ වී ඇත.<br>1. මරුවැල්<br>2. නිම් මත්ස්‍ය දැල්<br>3. රෙදි දැල්<br>දැනට පවතින බදු තවදුරටත් අඩු කිරීම සඳහා සාකච්ඡා පවත්වමින් පවතී. |
| 64 | විදේශ ධීවර යාත්‍රා ලංකා මුහුදු සීමාව ආක්‍රමණය කිරීම වැළැක්වීම. | විදේශ කටයුතු<br>රාජ්‍ය ආරක්ෂක<br>ධීවර | | අමාත්‍යාංශ විසින් ඒකාබද්ධ යෝජනාවක් සකස් කළ යුතුය. | මුර සංචාර තර කර ඇත. නාවික සැතපුම් 200 ක් දක්වා ඇත මුහුදේ සංචාරය කළ හැකි නැව් දෙකක් 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවට ලැබීමට නියමිතය. නාවික අභ්‍යාස අවසන් කර ඇත. රේඩාර් පද්ධතිය වැඩිදියුණු කරගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාව, ඉන්දියාව හා මාලදිවයින අතර 2015 ජූනි වන විට ගිවිසුමකට එළඹීමට නියමිතය. |
| 65 | මත්ස්‍ය අපනයනය සඳහා අහිමිවී තිබෙන යුරෝපා වෙළඳපොල නැවත ලබා ගැනීම. | ස්වදේශ කටයුතු හා ධීවර<br>විදේශ කටයුතු | | යුරෝපා සංගමය විසින් නියම කර ඇති අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා 2015.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමාත්‍යාංශය විසින් යාත්‍රා සුපරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය | i. 2015 වසර සඳහා අවශ්‍ය රුපියල් මිලියන 90 ක ප්‍රතිපාදන සලසා ඇත.<br>ii. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට විද්වත් කමිටුවක් පත් කර ඇත.<br>iii. මෙයට අදාළ කාර්යයන් 58 ක් පවතින අතර පෙබරවාරි මාසය තුළ සපුරාලිය යුතු කාර්යයන් 19 න් 18 ක් අවසන් කර ඇත.<br>iv. බහු දින ධීවර යාත්‍රා වල සවි කිරීම සඳහා ට්‍රාන්ස්පොන්ඩර්ස් 50 ක් මිලදී ගැනීමට 2015.03.04 දින ණයවර ලිපි විවෘත කර ඇත. |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| | | | | | v. බෝට්ටු පරික්ෂාව සඳහා ක්‍රමවේදයක් ස්ථාපනය කර ඇත<br>vi. අදාළ නව රෙගුලාසි පැණවීමට කටයුතු කර ඇත.<br>vii. යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය (VMS) සම්බන්ධයෙන් ධීවරයින් හා නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.<br>viii. ඉන්දියන් සාගරයේ ටූනා කොමිසමේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් ජාතික ධීවර පරීක්ෂණ සැලසුම කෙටුම්පත් කර ඇත.<br>ix. ඉදිරි සැලසුමේ ප්‍රගතිය මැයි මස දී යුරෝපා කොමිසමට දැන්වීමට නියමිතව ඇත. |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 66 | කුණාටු සහ මුහුදේ ඇතිවන කැළඹීම් තත්ත්වයන් ගැන නිවැරදි තොරතුරු කඩිනමින් ධීවරයා වෙත ලබාදිය හැකි කාලගුණ විමර්ශන වැඩ පිළිවෙලක් සකස් කිරීම. | මහජන සාමය හා<br>ආපදා කළමණාකරණ<br>ස්වදේශ කටයුතු හා ධීවර | | අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර අමාත්‍යාංශ විසින් යෝජනාවක් සකස් කළ යුතුය | i. ධීවරයන්ට කාළගුණය පිළිබඳ නිවැරදි තොරතුරු ලබා දීම සඳහා විමර්ශන වැඩපිළිවෙලක් කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතී.<br>ii. ධීවර යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය පිහිටුවීමෙන් පසු එම පද්ධතිය හරහා බහුදින ධීවර යාත්‍රා සඳහා කාලගුණ තොරතුරු ලබා දීමට කටයුතු කෙරෙමින් පවතී.<br>iii. අයහපත් කාලගුණික තත්ත්වයන් කෙටි පණිවිඩයක් මඟින් නොමිලේ එක් දින ධීවර යාත්‍රා වෙත ලබා දීම සම්බන්ධයෙන් වන කරුණු ඩයලොග් ආයතනය සමඟ සාකච්ඡා කර ඇත. |
| 67 | ඇහිරී ඇති වාරි පද්ධතිය යළි ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කිරීම. | වාරිමාර්ග හා කෘෂිකර්ම මහවැලි සංවර්ධන | මුදල්<br>රාජ්‍ය පරිපාලන | වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු යොවුන් සේනාංකය යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් කඩිනම් වැඩසටහනක් සකස් කළ යුතුය. | i. වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කර ඇත. ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග පිළිබඳව සමාලෝචනය කෙරෙමින් පවතී.<br>ii. රොන්මඩ ඉවත් කිරීමේ දී සිදුවන පාංශු බාදනය අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයන් හඳුනා ගනිමින් පවතී. |
| 68 | ගොඩ වී ඇති වැව්වල රොන්මඩ ඉවත් කිරීම ආරම්භ කිරීම. | වාරිමාර්ග හා කෘෂිකර්ම මහවැලි සංවර්ධන | මුදල්<br>රාජ්‍ය පරිපාලන | | |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

<table>
<tr><th rowspan="2">#</th><th rowspan="2">යෝජනාව</th><th colspan="2">ක්‍රියාත්මක කිරීමේ වගකීම</th><th rowspan="2">මෙහෙයුම් කමිටුවේ නිර්දේශය</th><th rowspan="2">වර්තමාන තත්වය</th></tr>
<tr><th>ප්‍රධාන ආයතනය</th><th>අනෙකුත් අදාළ ආයතන</th></tr>
<tr><td>69</td><td>දැනට තණකොළ කැපීමට, පාරවල් අතු ගෑමට, කානු ශුද්ධ කිරීමට යොදවා ඇති විරෝදාර රණවිරුවන් එයින් මුදවා ගෙන ත්‍රිවිධ හමුදාව, හමුදා වැඩ කටයුතුවලට පමණක් සීමා කිරීම.</td><td>ආරක්ෂක</td><td></td><td>ඉංජිනේරු බලකාය හැර අනිකුත් හමුදා බලකායන් තුළින් අදාළ අංශ හඳුනා ගැනීම.</td><td>මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත.</td></tr>
<tr><td>70</td><td>දේශපාලනීකරණයට ලක්වී ඇති පොලිසියේ උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදය අහෝසි කර විධිමත් හැකියාව, දක්ෂකම, කැපවීම හා කාර්යක්ෂමතාව මත පදනම් වූ උස්සවීම් ලබාදීමේ ක්‍රමයක් සකස් කිරීම.</td><td>රාජ්‍ය පරිපාලන මහජන සාමය</td><td></td><td>රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අධ්‍යක්ෂ ජනරාල් (ආයතන) සමඟ සාකච්ඡා කර සුදුසු යෝජනාවක් ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුය.</td><td rowspan="2">i. මේ වන විට බඳවාගැනීමේ පටිපාටි දෙකක් සඳහා අනුමැතිය ලැබී ඇත.<br>ii. නිලධාරීන්ගේ ජොෂ්ඨත්වය සම්බන්ධ ගැටළු සහ ඒකාබද්ධ කිරීමේදී පැන නගින අක්‍රමිකතා පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා සාකච්ඡා පවත්වා ඇත.<br>iii. යෝජනා අංක 71 සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගනු ලැබූ තීරණය පිළිබඳව කරන ලද සාකච්ඡාවන්ගේ ප්‍රතිඵල අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.</td></tr>
<tr><td>71</td><td>උප පොලිස් සේවයේ නිලධාරින් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී එතෙක් නිත්‍ය සේවයේ යෙදී සිටි නිලධාරින්ට සිදුවූ අගතිය නිවැරදි කිරීම හා නිත්‍ය සේවයේ නිලධාරින්ගේ ජොෂ්ඨත්වය ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම.</td><td>රාජ්‍ය පරිපාලන මහජන සාමය රා.සේ.කො</td><td></td><td>රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අධ්‍යක්ෂ ජනරාල් (ආයතන) සමඟ සාකච්ඡා කර සුදුසු යෝජනාවක් ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුය.</td></tr>
</table>

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 72 | මැති ඇමතිවරුන් හා ඔවුන්ගේ පවුල්වල උදවියගේ ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදාව යොදා ගැනීම වහාම නතර කිරීම හා නියමිත පටිපාටීන්ට අනුකූලව පොලිස් ආරක්ෂාව ඔවුන්ට ලබාදෙන අතර, ආරක්ෂක රථ පිරිවරාගෙන මහජනයාට පීඩා වන ආකාරයෙන් මැති ඇමතිවරුන් ගමන් කිරීම නැවැත්වීමට පියවර ගැනීම. | ආරක්ෂක මහජන සාමය | | මේ සම්බන්ධව ආරක්ෂක කවුන්සිලය විසින් ගන්නා ලද තීරණය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 73 | වතුකරයේ ජනතාව දැනට ජීවත්වන දුෂ්කර 'ලයින් කාමර' ජීවිතයෙන් මුදවාගෙන ඔවුන්ට ඉඩම් අයිතිය ද සමඟ සැබෑ නිවසක හිමිකාරත්වය ලබාදීම. | වැවිලි යටිතල පහසුකම් ප්‍රතිපත්ති සම්පාදන | නිවාස හා සමෘද්ධි වැවිලි කර්මාන්ත | මෙය ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන සමග සාකච්ඡා කර අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. | i. ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. බදුල්ල සහ නුවර එළිය ප්‍රදේශයන්හි නායයාම් වලින් විපතට පත් වූ ජනතාවට නිවාස තනා දීම ආරම්භ කර ඇති අතර, ඉදිරියේදී මෙම පහසුකම අනෙකුත් ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීමටද කටයුතු යොදා ඇත<br>ii. නායයෑම් වලින් විපතට පත් වූවන් සඳහා නිවාස 375 ක් ඉදි කිරීම සම්බන්ධයෙන් ඉඩම් නිරවුල් කිරීම අවසන් කර ඉදි කිරීම් ආරම්භ කර ඇත.<br>iii. ඉන්දියානු ආධාර යටතේ නිවාස 4000 ක් ඉදි කිරීම සඳහා වියදම් ඇස්තමේන්තුව හා සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත.<br>iv. නව නිවාස 20,000 ක් හා පවතින ලයින් කාමර 30,000 ක් නවීකරණය කිරීම සඳහා ඉන්දියානු රජයෙන් මුදල් ආධාර ලබා ගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත.<br>v. වැවිලි ප්‍රජාවගේ සමාජ සංවර්ධනය සඳහා දස අවුරුදු ජාතික සැලැස්ම සකස් කිරීමට ජාතික වැඩමුළුව 2015.04.30 දින පැවැත්වීමට සැලසුම් කර ඇත. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| | | | | | vi. අන්තර් ක්‍රියාකාරකමක් ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ පවුල් 500 ක් සඳහා නීත්‍යානුකූල භුක්තිය ලබා දීමේ ලේඛන ලබා දීමට අවශ්‍ය කටයුතු 2015.04.25 දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සිදු කිරීමට නියමිතය. |
| 74 | බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, කෑගල්ල යන දිස්ත්‍රික්කවල වතුකරයේ ජනතාවගේ දරුවන්ට දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ විද්‍යා විෂයයන් හැදෑරිය හැකි වන පරිදි පහසුකම් සහිත පාසල් ආරම්භ කිරීම. | අධ්‍යාපන රා.අ. අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන | වැවිලි කර්මාන්ත නිවාස හා සමෘද්ධි | මුල් පියවර වශයෙන් වතුකරය ආශ්‍රිත ප්‍රදේශ වල මෙම පහසුකම් සැලසිය යුතු පාසල් ප්‍රමුඛතා පදනම මත හඳුනාගත යුතුය. | i. දමිළ මාධ්‍ය ගුරු සහායකයින් 3026 ක් සබරගමුව, ඌව සහ මධ්‍යම පළාත්වල එම ගුරුවරුන් හිඟ ප්‍රදේශවලට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත.<br>ii. අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සැලසුමක් සකස් කරමින් පවතී. පාසල් වල විද්‍යා උපකරණ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.<br>iii. විද්‍යා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා වතුකරයේ පාසැල් 23 ක් හඳුනාගෙන ඇති අතර, මෙම පැසැල් වලට උපාධිධාරී ගුරුවරුන් 130 ක් බඳවා ගැනීමට අප්‍රේල් මස 17 දින ගැසට් පත්‍රය මගින් අයදුම්පත් කැඳවා ඇත. |

# දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 75 | නීති විරෝධී ලෙස තම නිවාසවලින් හා ඉඩම්වලින් විවිධ හේතු මත ඉවත් කළා වූ සියලු පුරවැසියන්ට සහන සැලසීම. | නාගරික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන | ආරක්ෂක නැවත පදිංචි කිරීමේ ඉඩම් | මෙහි පළමු පියවර වශයෙන්, කොළඹ නගරයේ සහ පලාලි, සාම්පූර් සහ පානම ආදී ප්‍රදේශවල වල බලපෑමට ලක් වූ පවුල් අමාත්‍යාංශය විසින් හඳුනාගත යුතුය. | දුක් ගැනවිලි වලට සහන සැලසීම සඳහා පත්කරන ලද කමිටුව විසින් සහන සැලසීමේ ක්‍රමවේදයන් සකස් කරමින් සිටී. 2015.03.25 දින පල කරන ලද පුවත්පත් දැන්වීම් වලට සහ තෝරාගත් ස්ථාන වල ප්‍රසිද්ධ කරන ලද දැන්වීම් වලට අනුව අගතියට පත් පාර්ශවයන්ගෙන් ලැබූ පැමිණිලි/ඇපැල් අධ්‍යයනය කරමින් පවතී. 2015.05.15 වන දිනට අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය. |
| 76 | කොළඹ නගරයේ නිවාස හා ඉඩම් අහිමි කරන ලද ජනතාවගේ එම දේපොළ යළි තක්සේරු කර ඒවාහි වටිනාකම දැනට ගෙවන නිවාස ණය මුදලින් අඩු කිරීම. | නාගරික සංවර්ධන | මුදල් | දේපොළ තක්සේරු කිරීමට අවශ්‍ය පියවර අමාත්‍යාංශය විසින් ගත යුතුය. | |
| 77 | හිසට සෙවණක් නොමැතිව ජීවත්වන ලක්ෂ ගණනක් වූ ජනතාවට නිවාස ලබාදීමේ කඩිනම් වැඩසටහනක් ආරම්භ කිරීම. | නිවාස හා සමෘද්ධි | ඉඩම් | මේ සඳහා සුදුසු ප්‍රතිලාභීන් සහ අවශ්‍ය ඉඩම් අමාත්‍යාංශය විසින් හඳුනාගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 78 | උතුරේත්, දකුණේත් ප්‍රජාතන්ත්‍රවාදී සිවිල් පාලනයක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම. | රාජ්‍ය පරිපාලන | | පළාත් බලධාරීන්ගේ එකඟතාවය මත අවශ්‍ය තැන්වලට සුදුසු රාජ්‍ය නිලධාරීන් පත්කිරීමට ක්‍රියා කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 79 | ජනවර්ග අතර හෝ ආගම් අතර අසමගිය, වෛරය, ආගමික නායකයන්ට අපහාස වන අයුරින් ක්‍රියාත්මක කිරීම හෝ ප්‍රකාශ කිරීම වැළැක්වීම සඳහා නීතිමය හා සමාජමය ක්‍රියාමාර්ග ගැනීම. | අධිකරණ ප්‍රතිපත්ති සම්පාදන රාජ්‍ය පරිපාලන | සියලුම ආගමික කටයුතු අමාත්‍යාංශය | දැනටමත් සකස්කර ඇති පනත් කෙටුම්පත අමාත්‍යාංශය විසින් සමාලොචනය කළ යුතුය. | නීති කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 80 | ආගමික ස්ථානවලට අවශ්‍ය රැකවරණය ලබාදීම. | මහජන සාමය රාජ්‍ය පරිපාලන | සියලුම ආගමික කටයුතු අමාත්‍යාංශ | අදාළ එක් එක් ආගමික අමාත්‍යාංශය විසින් අවශ්‍යතා හඳුනාගත යුතු අතර, අවශ්‍ය පියවර ගැනීමට මහජන සාමය අමාත්‍යාංශයට ඉල්ලීම් කළ යුතුය. | i. ආගමික ස්ථානවලට අවශ්‍ය රැකවරණය ලබාදීම පිළිබඳව දැනටමත් ඒකකයන් පිහිටුවා ඇති බැවින් එම ඒකකය ශක්තිමත් කරමින් මෙම ආරක්ෂාව සපයා දීමට අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්මක් සකස් කෙරෙමින් පවතී.<br>ii. රැකවරණය ලබා දියයුතු ආගමික සිද්ධස්ථාන ඇතුළත් ලේඛණයන් බුද්ධශාසන අමාත්‍යාංශය හා මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත්කර ඇත. |
| 81 | ආගමික සහජීවනය වෙනුවෙන් ක්‍රියා කරන හා අන්තවාදයට එරෙහිව සෘජුව කටයුතු කරන ආගමික නායකයින්ගෙන් සමන්විත ප්‍රාදේශීය හා ජාතික මණ්ඩල ස්ථාපිත කිරීම. | සියලුම ආගමික කටයුතු අමාත්‍යාංශ රාජ්‍ය පරිපාලන | | අදාළ අමාත්‍යාංශය විසින් මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය. | ප්‍රාදේශීය කමිටු පත්කිරීම සඳහා පළාත් මට්ටමේ ආගමික නායකයින් වෙතින් නාමයෝජනා ලැබෙමින් පවතී. |
| 82 | පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම. | රා.අ/ සංස්කෘතික කටයුතු ප්‍රතිපත්ති සම්පාදන | | පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයින් මේ සඳහා යෙදවීම. | මොනරාගල, අනුරාධපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල වැඩමුළු දෙක බැගින් වැඩමුළු හයක් පවත්වා ඇත. |
| 83 | ශ්‍රී දළදා මාළිගාව ඇතුළු පූජනීය ස්ථාන ආශ්‍රිතව පවත්වාගෙන යන සුරාසැල් එම ස්ථානවලින් වහාම ඉවත් කරන අතර, එම පූජා භූමි අවට කාර් රේස් පැවැත්වීම වහාම තහනම් කිරීම. | මුදල්, රාජ්‍ය පරිපාලන මහජන සාමය | ස්වදේශ කටයුතු | බලපත්‍ර නිකුත්කිරීම සම්බන්ධව දැනට පවතින මාර්ගෝපදේශ සලකා බලා අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධව අදාළ පියවර ගත යුතුය. | i. මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නීතිපති වෙතින් නිරීක්ෂණ විමසා ඇත.<br>ii. කාර් රේස් පැවැත්වීම නවත්වා ඇත. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 84 | යෝජිත බෞද්ධ විහාර හා දේවාලගම් පනතේ සංශෝධන මහානාහිමිපාණන් වහන්සේලාගේ අවවාද, අනුශාසනා, මඟපෙන්වීම හා අනුමැතිය මත සිදු කිරීම. | බුද්ධශාසන අධිකරණ, රාජ්‍ය පරිපාලන | රාජ්‍ය පරිපාලන | i. යෝජිත පනත් කෙටුම්පත් අති පූජ්‍ය මහානායක ස්වාමින්වහන්සේලා වෙත යොමු කිරීම.<br>ii. එම පනත් කෙටුම්පත අදාළ අමාත්‍යවරුන් විසින් සමාලෝචනය කිරීම. | i. අති පූජ්‍ය මහනායක ස්වාමින් වහන්සේලාගේ නිරික්ෂණ ඇතුළත් යෝජිත පනත් කෙටුම්පත නිති සම්පාදක වෙත ඉදිරිපත් කිරිම සඳහා අනුමැතිය ලබා ගැනිමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.<br>ii. එම පනත් කෙටුම්පත අදාළ අමාත්‍යවරුන් විසින් සමාලෝචනය කෙරෙමින් පවතී |
| 85 | සම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම උදෙසා හා දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම් සඳහා වැඩසටහනක් ආරම්භ කිරීම. | අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන | රාජ්‍ය පරිපාලන බුද්ධශාසන | ආගමික අධ්‍යාපනය සඳහා අවශ්‍ය ගුරු අවශ්‍යතාව හඳුනා ගනිමින් ගුරුවරුන් පත් කිරීම සිදුකිරීම. | පිරිවෙන් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා වසර 03 කට අදාළ සැලැස්මක් සකස් කර ඇත. 2015 සැලැස්ම තුල පිරිවෙන් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් ඇතුලත් වේ. |
| 86 | පිරිවෙන් අධ්‍යාපනය ජාත්‍යන්තර මට්ටමට ඉහළ නැංවීම උදෙසා ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයක් ඇති කිරීමට අවශ්‍ය පසුබිම සැකසීම. | උසස් අධ්‍යාපන රාජ්‍ය පරිපාලන අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන | බුද්ධශාසන | ප්‍රවීන හිමිවරුන් විමසමින් මේ සඳහා සුදුසු යෝජනාවක් ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කළ යුතුය. | ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය හා බෞද්ධ හා පාළි විශ්ව විද්‍යාලය මගින් ඉදිරිපත් කල යෝජනා 2 ක් අධ්‍යයනය කෙරේ. මේ සම්බන්ධව පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී |
| 87 | සත්ත්ව හිංසනය වැලැක්වීම සඳහා නීති පැනවීම. | සමාජ සේවා සහ පශු සම්පත් සංවර්ධන | | පනත් කෙටුම්පත අධ්‍යයනය කර එය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල නියෝගයට අනුව සත්ත්ව හිංසනය පිළිබඳ පනත නැවත සමාලෝචනය කරමින් පවතී. |
| 88 | ආර්ථික, සමාජ සංවර්ධනය, මානව හිමිකම්, පාරිසරික සහ යහපාලනය ආදී ක්ෂේත්‍රවලට අදාළ පුරවැසි සංවිධානවලට තම කටයුතු කරගෙන යාම සඳහා දැනට තිබෙන බාධා ඉවත් කිරීම. | ප්‍රතිපත්ති සම්පාදන | අධිකරණ නීතිපති දෙපාර්තමේන්තුව විගණකාධිපති දෙපාර්තමේන්තුව | රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය විසින් පෙබරවාරි 26 වැනි දින වන විට වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් සැපයීමටත් මාර්තු මස අවසන් වන විට සවිස්තරාත්මක වාර්තාවක් සැපයීමත් කළ යුතුය. | උපදේශන මණ්ඩලයේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර සවිස්තර වාර්තාව සකස් කරමින් පවතී. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 89 | සියලු කලා මාධ්‍යයන් සහ කලාකරුවන්ගේ නිර්මාණ ඇගයෙන සහ ස්වාධීනත්වය ආරක්ෂා කෙරෙන ව්‍යුහයක් නිර්මාණය කිරීම. | රා.අ/ සංස්කෘතික කටයුතු ප්‍රතිපත්ති සම්පාදන | | මේ සඳහා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යංශය විසින් කලාකරුවන්ගේ සහයෝගය ඇතිව වැඩසටහනක් සකස් කළ යුතුය. | සංස්කෘතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීමට අවශ්‍ය අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා විවිධ කලා ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ කලාකරුවන් සමග සාකච්ඡා කෙරෙමින් පවතී. |
| 90 | සියලු ජනමාධ්‍යකරුවන්ගේ හා ආයතනවල නිදහස ආරක්ෂා වන කෙටිකාලීන හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් දියත් කිරීම. | ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු රාජ්‍ය පරිපාලන | | අමාත්‍යාංශ විසින් සුදුසු වැඩසටහනක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. | i. ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම සිදුකරමින් පවතී .<br>ii. මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ දුක්ගැනවිලි සොයා බැලීම සඳහා බලධරයෙකුපත්කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.<br>iii. ජනමාධ්‍යවේදීන් සඳහා පිළිගත් හැඳුනුම්පතක් ලබාදීම බලගැන්වීමේ කටයුතු සිදුවෙමින් පවතී.<br>iv. රාජ්‍ය මාධ්‍යය ආයතන විසින් රූපවාහිනී හා ගුවන් විදුලිය මගින් විකාශනය කරනු ලබන ගීත වෙනුවෙන් කර්තෘභාග ගෙවීම සඳහා ගෙවීම් ක්‍රම වේදයන් දැනටමත් ක්‍රියාත්මක කර ඇත. |
| 91 | මත දැරීමේ හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම. | ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු | අධිකරණ රාජ්‍ය පරිපාලන | අදාළ පනත් කෙටුම්පත පිළිබඳ සියලුම අමාත්‍යාංශ වලින් අදහස් ලබා ගැනීම. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 92 | පාර්ලිමේන්තුවේ රැස්වීම් සජීවී ලෙස රූපවාහිනී මාධ්‍යයෙන් විසුරුවා හැරීම. | ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු | | ගරු කතානායකතුමා සහ පක්ෂ නායකයින් සමඟ සාකච්ඡා කර සුදුසු වැඩ පිළිවෙලක් පාර්ලිමේන්තු මහා ලේකම් විසින් ඉදිරිපත් කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |
| 93 | ජාත්‍යන්තර යුද අපරාධ අධිකරණය ස්ථාපිත කළ රෝම ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව අත්සන් තබා නැති නිසා එවැනි චෝදනා වෙතොත් ඒ පිළිබඳ යුක්තිය පසිඳලීමේ කාර්යය දේශීය ස්වාධීන අධිකරණයක් යටතේ සිදු කිරීම. | ජනාධිපති ලේකම් අග්‍රාමාත්‍ය ලේකම් අධිකරණ ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු | විදේශ කටයුතු | අදාළ අධිකාරීන් සමග සාකච්ඡා කර සුදුසු යාන්ත්‍රණයක් සකස් කර ඉදිරිපත් කළ යුතුය | කටයුතු කෙරෙමින් පවතී. |
| 94 | හිටපු හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා සහ 43 වෙනි අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක මහත්මිය ඇතුළු දේශපාලන පළිගැනීම් හා දඬුවම්වලට ලක්වූවන්ට අහිමි වූ තනතුරු හා අයිතිවාසිකම් යළි ලබාදීම. | ජනාධිපති ලේකම් කාර්යාලය | අධිකරණ ආරක්ෂක | අදාළ බලධාරීන් විසින් මේ සම්බන්ධව ක්‍රියා කළ යුතුව ඇත. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත. |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 95 | දේශපාලනීකරණය නොවූ ගෞරවනීය විදේශ සේවයක් නැවත ස්ථාපිත කිරීම. | විදේශ කටයුතු | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ශ්‍රී ලංකා විදේශ සේවා සහ රාජ්‍ය සේවා නිලධාරීන් හැර අනිකුත් රාජ්‍ය තාන්ත්‍රික දූත සේවා තනතුරුවලට පත්කර ඇති පිරිස් නැවත කැඳවීමට පියවර ගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 96 | අප රටේ සංරක්ෂිත කලාප ලෙස නීතියෙන් නියම කර ඇති භූමි භාග ආරක්ෂා කර ගැනීම හා ඒවායේ මායිම්වල සුරක්ෂිතබව පිළිබඳ වගබලා ගැනීම. | මහවැලි සංවර්ධන හා පරිසර ප්‍රතිපත්ති සම්පාදන | මහජන සාමය | අදාළ ව්‍යවස්ථාපිත ආයතන සහ පාරිසරික සංවිධාන එකමුතුව (Federation of Environmental Organizations) සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 97 | පාරිසරික වශයෙන් වටිනා හා දැනට විනාශවීමේ තර්ජනයට මුහුණ පා ඇති කලාප තවදුරටත් හඳුනාගෙන ඒවා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | මහවැලි සංවර්ධන හා පරිසර ප්‍රතිපත්ති සම්පාදන | | අදාළ ව්‍යවස්ථාපිත ආයතන සහ පාරිසරික සංවිධාන එකමුතුව (Federation of Environmental Organizations) සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගත යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |

## දින 100 වැඩසටහන - 2015 අප්‍රේල් 23 වන දිනට ප්‍රගතිය

| # | යෝජනාව | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මෙහෙයුම් කමිටුවේ නිර්දේශය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | ප්‍රධාන ආයතනය | අනෙකුත් අදාළ ආයතන | | |
| 98 | දැනට හානි සිදුවී ඇති හෝ විනාශවීමේ අවදානමට මුහුණ දී ඇති පාරිසරික වශයෙන් වටිනා කලාප ලොව පවතින නවීනතම විද්‍යාත්මක දැනුම් උපයෝගී කරගෙන නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට පියවර ගැනීම. | මහවැලි සංවර්ධන හා පරිසර ප්‍රතිපත්ති සම්පාදන | | අදාළ ව්‍යවස්ථාපිත අධිකාරීන් සහ පාරිසරික සංවිධාන සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගැනීම. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 99 | සත්ත්ව හා වෘක්ෂලතා ආඥාපනත නොබියව හා පක්ෂග්‍රාහී බැවින් තොරව දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම. | සංචාරක හා ක්‍රීඩා ප්‍රතිපත්ති සම්පාදන | මහවැලි සංවර්ධන හා පරිසර මහජන සාමය | මෙම ආඥා පනත ක්‍රියාත්මක කිරීමේදී පවතින නීතිමය අඩුපාඩුකම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර අමාත්‍යාංශය විසින් නිර්දේශ කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |
| 100 | සංවර්ධන වැඩසටහන්වල සංකල්පිත අවධියේදීම පාරිසරික බලපෑම් පිළිබඳ මූලික ඇගයීමක් අනිවාර්ය කිරීම. | මහවැලි සංවර්ධන හා පරිසර (මධ්‍යම පරිසර අධිකාරිය) ප්‍රතිපත්ති සම්පාදන | රාජ්‍ය පරිපාලන ආයෝජන ප්‍රවර්ධන | පවතින නීති විමර්ශනය කරමින් අදාළ ව්‍යවස්ථාපිත ආයතන සහ පාරිසරික සංවිධාන එකමුතුව (Federation of Environmental Organizations) සමඟ සාකච්ඡා කරමින්, අමාත්‍යාංශය විසින් සංශෝධන ඇත්නම් ඒවා යෝජනා කළ යුතුය. | මෙම යෝජනාව ක්‍රියාත්මක කර ඇත |